## අලුත් පරම්පරාවට අලුතින් සිතන්න - න්‍යාය පත්‍රයක්

*ශ්‍රී ලංකාවට ආඩම්බර විය හැකි විශිෂ්ඨ ඉතිහාසයක් තිබේ. මූලික වටිනාකම් අපගේ අධ්‍යාත්මයට පදනමක් වී ඇත. එකිනෙකට වෙනස් සමාජ ආර්ථික සහ ජාත්‍යන්තර බලවේග වලට මුහුණ දුන් මෙරට ජන සමාජය එක්තරා සන්ධිස්ථානයකට ප්‍රවේශ වී සිටී. එය තාක්ෂණ යුගයක් අභිමුවෙහි වන අතර වත්මන් ජන සමාජයට උපකල්පනය කරන්නට ද අසීරු තරමේ පරිවර්තනයකට රට යොමු වන බව පැහැදිලිය. එය වැලැක්විය නොහැකිය. රාජ්‍ය, පරිපාලනය, ආර්ථිකය, මාධ්‍ය හා ව්‍යාපාර ඇතුළු ක්ෂේත්‍රවල පවතින ව්‍යුහය ආන්දෝලනාත්මක වෙනසකට ලක් වනු ඇත. එපමණක් නොව භූගෝලීය ලක්ෂණ ද අනාගතයේ දී කිසිසේත් වලංගු නොවෙන බව දැක්විය යුතුය. වර්තමානය අත් හැරිය නොහැකි තීරණාත්මක අවස්ථාවකි. අලුත් පරම්පරාවට අලුතින් සිතන්නට සුදුසු වකවානුවකි. එයට ප්‍රවේශයක් සකස් කිරීම මෙම න්‍යාය පත්‍රයේ අරමුණයි.*

## දැක්ම

■ අපේ සමාජයේ සෑම මට්ටමකම සිටින නායකයන්ගෙන් විශාල පිරිසක් පැරණි මතධාරී යල් පැනගිය අයවලුන් වන අතර 21 වැනි සියවසේ තාක්ෂණය ඔස්සේ වේගවත් වෙනසකට භාජනය වෙමින් ඉදිරියට යෑම සඳහා අපට නායකත්වය ලබාදීමට තරම් හැකියාවන්ගෙන් සන්නද්ධවී නොමැති බව අප මුහුණ දිය යුතු යථාර්ථයකි. කලකිරීම හා අපේක්ෂා භංගත්වය හේතුවෙන් හොඳම හා දක්ෂම ශ්‍රී ලාංකිකයන් බොහෝ දෙනෙක් ඉකුත් කාලයේ රටින් පිටව ගියහ. තවත් පිරිසක් පිට වෙමින් සිටිති. සමාජ ආකල්පවල විප්ලවීය වෙනසක් නොකළහොත් මෙකී බුද්ධිගලන ප්‍රවණතාව ආපසු හැරෙතැයි සිතිය නොහැකිය. අභ්‍යන්තර පටු කාරණා කෙරෙහි යොමුවූ, වැටහීමක් නැති ළිං මැඩි දේශපාලනයේ විපාක වශයෙන් අපේ තරුණ ප්‍රජාව අකර්මන්‍යව සිරවී ඇති අතර ඔවුන්ගෙන් සමාජයට වැඩදායක සංවර්ධන කාර්යභාරයක් ඉටුවීම වළකා ඇත. අපේ සැබෑ හැකියා විභවය යථාර්ථයක් වන්නේ සමාජය, රජය, දේශපාලනය සහ ආර්ථිකය තුළ පරිවර්කනයක් කරන්නට ධෛර්යයක් වෙතොත් පමණකි.

■ අපේ දේශපාලන සංස්කෘතියෙහි දශක පහකට ආසන්න කාලයක් තිස්සේ රට තුළ පැවැති දුෂ්ඨ හා වෛරී දේශපාලන චක්‍රය අවසන් කළ යුතුය.

■ ශ්‍රී ලාංකීය අනන්‍යතාව කුමක්දැයි අර්ථ දක්වමින් ඉදිරියට රැගෙන යා හැකි සර්ව සම්පූර්ණ ජාතික ව්‍යාපෘතියක් සැලසුම් කළ යුතුය.

■ දේශපාලන, ව්‍යාපාරික, මාධ්‍ය හා සිවිල් සමාජ නායකයින්ගේ අලුත් මතු පරපුර සම්බන්ධ කරගෙන ජාතික දැක්මක් සහ ශක්තිමත්, ආචාර ධර්ම පද්ධතියක් සහිතව කරන, මහජන සේවා පොදු වැඩ පිළිවෙලක් ගොඩනැගීම අවශ්‍යය.

■ නීතියේ පාලනය ඉහළින්ම සලකන අතර විනයගරුක සමාජයක් ගොඩනැගිය යුතුය.

■ වත්මන් සංහිඳියා ක්‍රියාවලිය අසම්පූර්ණ සහ වැරදි සංකල්ප මත පදනම් වූවකි. එයට ජාතික මට්ටමේ නීත්‍යානුකූලභාවයක් නැත. කාලයක් තිස්සේ ආමන්ත්‍රණය නොකරන ලද ආගමික, පන්ති හා ජාතික මට්ටමේ අසාධාරණ බෙදීම් තවත් නරකින් නරකට හැරවීම එයින් සිදුවෙයි. ශ්‍රී ලංකාවේ සමාජ යථාර්තය වන සංකීර්ණ සහ පහසුවෙන් බේධ කළ හැකි කරුණු කෙරෙහි සංවේදී බවක් නැති, අතීත කර්කශ වේදනා සහගත සිද්ධි හාරා ඇවිස්සීමෙන් වෛරය දළු ලා, බෙදීම් තවදුරටත් පුළුල් වීම සිදුවෙයි. එවැන්නකින් භයානක විපාක ඇති විය හැකි බව ඉතිහාසය පෙන්වා දී ඇත.

■ ජාති, ආගම්, පන්ති, භාෂා, භූගෝලීය හා දේශපාලනික වෙනස්කම් මත අපේ සමාජය බේද භින්න වී එකිනෙකාගෙන් ඈත්වෙමින් තිබේ. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ඇතිවූ වටහාගත නොහැකි ප්‍රචණ්ඩත්වයට හේතු වූයේ මෙකී ගැඹුරු බෙදීම් හා සමාජය දුරස්වීමයි. ප්‍රශ්න නිරාකරණයට දේශියව උත්පාදිත සියලු අංශ සම්බන්ධකරගත් නිර්දේශපාලනික සංහිඳියා ක්‍රියාවලියක් අවශ්‍යය.

■ ශක්තිමත් ජාතික අනන්‍යතා රාමුවක සිට අභියෝගාත්මක සංවර්ධන ක්‍රමෝපායයක් නවීකරණයකින් යුතුව අරඹනු සඳහා අනුපමේය අවස්ථාවක් වර්තමානයේ ශ්‍රී ලංකාවට ලැබී ඇත. මූලික කරුණු ක්‍රමවත් කරගනිමින් මෙරට රාජ්‍ය හා දේශපාලන ව්‍යුහය ඉදිරියට යෑම පිණිස සියලු ආර්ථික සහ සමාජ ප්‍රතිපත්ති සම්බන්ධ සංවර්ධන මූලෝපායන් හි ව්‍යුහය නැවත අගැයීමට කාලය එළැඹ ඇත. නිදහස දිනාගෙන වසර 70 ක් සහ ඒ අතර 30 අවුරුදු යුද්ධයකින් හෙම්බත්වී සිටින අප අපගේ වෙනස්කම් පසෙක ලා වේගයෙන් අවිනිශ්චිතව ඉදිරියට යන ලෝකයක අභියෝගවලට මුහුණදීය යුතුව තිබේ.

## සමාජය සහ සමාජ වටිනාකම්

■ මෙරට ආගමික නායකයන්ගේ වැදගත් භූමිකාව හඳුනාගත යුතුය. රටට අවශ්‍ය අධ්‍යාත්මික මගපෙන්වීම උදෙසා ජාතික සංඝ උපදේශක සභාවක් හා අන්තර් ආගමික උපදේශක සභාවක් පත් කළ යුතුය. එහි උපදේශනය ව්‍යවස්ථාවෙන්ම බලාත්මක කළ යුතුය.

■ යහපත් පුරවැසියන් බිහිකරනු සඳහා අධ්‍යාපනය ඉතා වැදගත්ය. මෙරට අධ්‍යාපන ක්‍රමයට සදාචාරාත්මක ගුණාංග හා ආචාරධර්ම අනිවාර්ය කළ යුතුය. කරුණාව, අන්‍යයන්ගේ මානුෂිකත්වයට ගරුකිරීම හුරු කෙරේ. ප්‍රචණ්ඩකාරී, වෛර සහගත සහ අවිනීත භාෂා භාවිතය හා හැසිරීම් මුළුමනින්ම ප්‍රතික්ෂේප කරන අතර, සන්සුන් ගෞරවාන්විත සාමකාමී හැසිරීම අධ්‍යාපනය

තුළින් ප්‍රවර්ධනය කෙරෙහි අවධානය යොමුකළ යුතුය. මෙය සිදුකරනු ලැබිය යුත්තේ ජාතික සංඝ උපදේශක සභාව හා අන්තර් ආගමික උපදේශක සභාවේ මගපෙන්වීම් යටතේය.

■ ශ්‍රී ලංකාවාසී වයස 18 සපිරූ සියලු පුරවැසියනට ජාතික සේවය අනිවාර්යය කළ යුතුය. ජාතික එකමුතුව හා විනය වර්ධනය කිරීම එහි අරමුණය.

■ ශ්‍රී ලංකාවේ තරු පහේ හෝටලයක මගුල් උත්සවයක එක් පුද්ගලයකුගේ කෑම වේලකට වැය කරන මුදලින් සාමාන්‍ය පුද්ගලයන් 50 දෙනකුට කෑම ලබාදිය හැකි වානිජ පසුබිමක් අද පවතී. සිතාගත නොහැකි මෙවැනි විෂමතා තුරන් කළ හැකි බවට සහතික වන සමාජ ක්‍රමයක් නිර්මාණය කළ යුතුය. හිස් වදන් හා දේශපාලනික බොරු පොරොන්දු වලින් තොර තීරණාත්මක ප්‍රායෝගික ආර්ථික හා සමාජ ප්‍රතිපත්තිවලින් එම ක්‍රමය සකස් කළ යුතුය.

■ නෑදෑ හිතවත්කම් මත පදනම් වූ දේශපාලන සමාජ හා ආර්ථික පද්ධතිය, නිදහසින් පසු මෙරට සමාජයේ ක්‍රමානුකූලව වැඩුණු ව්‍යුහගත දූෂණයට බලපාන ප්‍රධාන හේතුවක් වූ අතර මෙම තත්ත්වය සමාජයේ සෑම පැතිකඩකම පාහේ විශේෂ බලය ඇති කණ්ඩායම්වල බලපෑමට හා එයම පැලපදියම් කරගැනීමට හේතු වී ඇත. සැඟවුණු පටු අභිලාෂ වෙනුවට ජනතාවගේ සැබෑ උවමනාවන් සමාජය තුළ මූර්තිමත්වන අයුරින් ඉහත දූෂිත පද්ධති මුලිනුපුටා දැමිය යුතුය.

■ යුක්තිය පසිඳලීම කඩිනම් කරනු සඳහා සමස්ත අධිකරණ පද්ධතියම වෙනස් කරන්නට අවශය. පූර්ව නඩු විභාග පටිපාටි ඇති කර බන්ධනාගාරය දැඩි ප්‍රතිසංස්කරණයකට ලක් කරන අතර මහජන නඩු පැවරුම් අධ්‍යක්ෂ (Director of Public Prosecutions) තනතුරක් නිර්මාණය කිරීමට පියවර ගතයුතුය.

■ නායකයන් ආදර්ශයෙන්ම නායකත්වය දෙන ආකාරයේ සමාජයක් බිහිකිරීම අවශ්‍යය. අගමැතිවරයා විදේශ සංචාරයක නිරත වන විට ගුවන් යානයේ සාමාන්‍ය සකසුරුවම් පන්තියේ ගමන් කළ යුගයක් බොහෝ වැඩිහිටියන්ගේ මතකයේ පවතී. දුක්විඳින සාමාන්‍ය ජනතාවගේ මුදලින් දේශපාලනඥයන් හා රජයේ නිලධාරීන් සිතාගත නොහැකි අන්දමේ අධි සුඛෝපභෝගී ජීවිතයක් ගතකරන යුගය අවසන් කළ යුතුය. රාජ්‍ය වරප්‍රසාද පාලනයකින් තොර අඩියකට වැටී ඇත. ඒවා ගැනැ තක්සේරුකර පාලනය කළ යුතුය. සුඛෝපභෝගි නිල රථ, තීරුබදු රහිත වාහන බලපත්‍ර, සීමාවකින් තොරව අනවශ්‍ය විදේශ සංචාර සහ සුඛෝපභෝගී නිල නිවාස ආදී සෑම එකක්ම පාලනය කළ යුතුය.

■ යුද තත්ත්වය අවසන් නමුත් ප්‍රභූ ආරක්ෂක සේවය හුදෙක් තත්ත්වය පෙන්වන සංකේතයකි. එමගින් ජනතාවට අපහසුතා ඇති කරවනවා පමණක් නොව මහජන මුදල් නාස්තියක් ද වේ. යුද්ධයෙන් පසු ප්‍රභූ ආරක්ෂාව එපමණකට අවශ්‍ය නොවේ. ප්‍රභූ ආරක්ෂාව, වෙනත් රටවල මෙන් ස්වාධීන මණ්ඩලයකින් තර්ජන ස්වභාවය තක්සේරු කිරීමෙන් පසු අවශ්‍ය මට්ටමට සැපයිය යුතුය.

■ සිවිල් සංවිධාන හා සමාජ ව්‍යාපාරවල ක්‍රියාකාරීත්වයට උපරිම ඉඩකඩක් ලබා දිය යුතුය. සක්‍රිය සිවිල් සමාජ නිරීක්ෂකයන් හා සවිඥානික විචාරශීලී මාධ්‍ය භාවිතාව දූෂණ හා වංචා වලට එරෙහි හොඳම පරීක්ෂාව සිදුකරනු ඇත.

■ සෑම මට්ටමකදීම රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකම ඒකාබද්ධ අධ්‍යාපන ක්‍රම පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය. පාරදෘශ්‍ය රෙගුලාසි හා දැඩි ප්‍රමිතියකින් යුක්ත විය යුතුය. සිසු සිසුවියන් සඳහා රජයේ වගකීම සහිත පුළුල් ණය යෝජනා ක්‍රමයක් අධ්‍යාපන පිරිවැය සඳහා ක්‍රියාත්මක කළ යුතුය.

■ රාජ්‍ය හා පෞද්ගලික අංශ ඒකාබද්ධවූ සෞඛ්‍ය සේවාවක් ද ක්‍රියාත්මක කළ යුතුය. දැඩි නියාමන රෙගුලාසි හා රෝගීන්ගේ අයිතිය ආරක්ෂා කිරීමේ වගන්ති ඇතුලත් විය යුතුය. මූලික ඉලක්ක ගත පදනමක් සහිත රාජ්‍ය අනුග්‍රහය ලත් සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.

■ වැඩි වයස්ගත, මධ්‍යම ආදායම් ලාභී සමාජයක මූලික අවශ්‍යතා ඉටුකැරෙන පරිදි සියලූ සමාජ සුබ සාධන යෝජනා ක්‍රම විප්ලවීය ප්‍රතිව්‍යුහගත කිරීමක් කළ යුතුය.

■ නියඟය හා ගංවතුර ඇතුළුව බලපවත්වන පරිසර හා දේශගුණ විපර්යාස අරභයා සියළු පාර්ශව සම්බන්ධකරගත් ජාතික සංවාදයක් ගොඩනැගිය යුතුය. පරිසර පද්ධතියේ සියුම් වෙනස්කම් හේතුකොටගෙන එල්ලවන අභියෝග ජයගැනීමට හුදු ප්‍රතිචාරාත්මක පමණක් නොවන සක්‍රීය ප්‍රායෝගික පියවර සංවර්ධනය කළ යුතුය. සියලූ අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් පරිසර මිතුරු සහ හරිත දෘෂ්ඨියකින් විමසිය යුතුය.

■ ජනතාවගේ සෞඛ්‍යය හා සමාජය තුළ සක්‍රීය චලනය තහවුරු වන පරිදි ක්‍රීඩා හා විවේක ක්‍රියාකාරකම් රජය සිට ප්‍රතිපත්තියක් වශයෙන් ප්‍රවර්ධනය කළ යුත්තේය. සේවයේ නිරත දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන් ක්‍රීඩා ආයතනවල නිලතල දැරීම තහනම් කළ යුතුය. ක්‍රීඩා සංවිධාන ස්වාධීනව හා අපක්ෂපාතීව නියාමනය කරනු පිණිස සුදුසුකම් සහිත විශේෂඥයන්ගෙන් සැදුම්ලත් විශේෂ ජාතික ක්‍රීඩා අධිකාරියක් පිහිටුවිය යුතුය.

## රජය හා පාලනය

■ සියළු දේශපාලන පක්ෂ තුළ නිත්‍යානුකූල ප්‍රතිසංස්කරණක් සිදුකළ යුතුය. එමගින් පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වන අතර, ඡන්ද ප්‍රචාරක කටයුතුවල පාරදෘශ්‍යභාවය, මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශ ඔස්සේ දේශපාලන පක්ෂ විසින් ඉදිරිපත් කරනු ලබන පොරොන්දුවල පිරිවැය දැක්වීම හා වගකීම දැරීම අනිවාර්යය නීති රීති හඳුන්වා දිය යුතුය. පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය හා වගකීම් සහගත බව ශක්තිමත් කිරීමෙන් පාර්ලිමේන්තුවේ හා පළාත් පාලන

ආයතන තුළ දේශපාලනඥයන්ගේ පටු අවස්ථාවාදී පක්ෂ මාරුකිරීම්වලට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගත හැකිය.

■ මහජන ඡන්දයෙන් ජනාධිපතිවරයා සෘජුව තෝරා පත්කර ගත යුතුය. මන්ද සියලු ශ්‍රී ලාංකිකයන්ට පොදුවේ හවුල් විය හැකි බල අධිකාරිය එයයි.

■ පාර්ලිමේන්තුවට වගකිව යුතු ජනාධිපති ධුරයක් වනු ඇත. ජාතික සමගිය, (අන්තර් ආගමික හා අන්තර් වාර්ගික කරුණු ඇතුළුව) ජාතික ආරක්ෂාව, ආර්ථික ස්ථාවරත්වය හා සමාජ සාධාරණත්වය ඇතිකිරීම සහ සමබර විදේශ ප්‍රතිපත්තිය යනාදී කාරණා සම්බන්ධයෙන් මැදිහත් විය හැකි බලතල හා වගකීම් ජනාධිපතිවරයාට ලැබෙන පැහැදිලිව අර්ථකථන දැක්විය යුතුය. ජනාධිපතිවරයාගේ අධිකාරීත්වය රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය හා පිරිසිදුබව වෙනුවෙන් සහ ආණ්ඩුව බලය අයුතු ලෙස භාවිතා කරන්නේදැයි පරීක්ෂා කර යම් තීරණාත්මක අවස්ථාවන්හි මැදිහත් විය හැකි ලෙස විය යුතුය.

■ ජනාධිපතිවරයෙකු හා උප ජනාධිපතිවරු දෙදෙනෙකු පත් කළ යුතුය. අවබෝධාත්මක ජාතික සංහිඳියා ක්‍රියාවලියකට නායකත්වය දීමේ වගකීම ඔවුහු දැරිය යුතු වෙති.

■ ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත්වන අපේක්ෂකයන් සිය උප ජනාධිපති අපෙක්ෂකයන් දෙදෙනකුද ඇතුළත් යෝජනා සමග තරග කළ යුතුය. තේරී පත්වූ පසු ජනාධිපතිවරයාත් උප ජනාධිපතිවරුන් කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දැරිය නොහැකිය.

■ ජනාධිපතිවරයා උප ජනාධිපතිවරුන් අගමැතිවරයා හා කැබිනට් ඇමැතිවරුන්ගේ අලුතින් අර්ථ දක්වන ලද විශේෂ කාර්යය හා වගකීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් විය යුතුය. කැබිනට් අමාත්‍ය ධුර සංඛ්‍යාව 30කට සීමා කළ යුතු අතර උප අමාත්‍ය ධුර ගණන ද ඒ හා සමාන විය යුතුය. ජනාධිපතිවරයා හා උප ජනාධිපතිවරුන්ට කිසිම කැබිනට් අමාත්‍ය ධුරයක් දැරිය නොහැකිය.

■ පාර්ලිමේන්තුව තෝරා පත්කරගනු ලබන්නේ සමානුපාතික නියෝජනය හා සෘජු ප්‍රතිඵලය යන ක්‍රම දෙක සම්මිශ්‍රණය වූ පිළිවෙළකටය. කෙසේ වෙතත් ස්ථාවර රජයක් පිහිටුවාගැවීම තහවුරු වන ආරක්ෂක ක්‍රමවේද ඇතුළත් කළ යුතුය. සෘජු ප්‍රතිඵලය යටතේ තේරී පත්වූ මන්ත්‍රී ආසනයක හදිසි පුරප්පාඩු පිරවීම සඳහා අතුරු මැතිවරණ ක්‍රමයක්ද ඇතුළත් කළ යුතුය.

■ වාර්ගික, ආගමික හා කලාපීය සමානාත්මතාව සම්බන්ධ කාරණාවලදී බහුතරවාදයට එරෙහිව ඵලදායී සංවරණ හා තුලන ක්‍රමයක් වශයෙන් ජනතාව ඡන්දයෙන් සෘජුව පත්කරගනු ලබන සෙනෙට් සභාවක් පිහිටුවනු ලැබේ.

■ 21 වැනි සියවසේ අභියෝගවලට මුහුණු දීම පිණිස රාජ්‍ය සේවය තුළ විශේෂ සේවයක් පුහුණු කොට සංවර්ධනය කළ යුතුය. එයට අමතරව කැබිනට් මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියට

උපදෙස් දෙනු පිණිස පළපුරුදු විශේෂඥයන්ගෙන් සමන්විත ප්‍රතිපත්ති උපදේශක සභාවක් පිහිටුවනු ලැබේ.

■ වාර්ෂිකව රුපියල් බිලියන 250ක පිරිවැයක් සිදුකරන නිරර්ථක පද්ධතියක් වූ පළාත් සභා අහෝසි කරනු ලැබිය යුතු අතර මහ නගර සභා නගර සභා සහ ප්‍රාදේශිය සභා යන පළාත් පාලන ආයතනවල බලතල හා වපසරිය ඉහළ නැංවිය යුතුය. අවශ්‍යතාවය අනුව මෙවැනි ආයතන තවත් නිර්මාණය කළ හැකිය. සවිබල ගැන්වූ පළාත් පාලන ආයතන පද්ධතියකට මූල්‍ය අරමුදල් විමධ්‍යගත කිරීම මගින් එක් එක් ආයතනයට මහා පරිමාණ ප්‍රජා සංවර්ධන සහ රාජ්‍ය ආයෝජන වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට අවශ්‍ය මූල්‍ය සම්පත් සම්පාදනය කරන වාර්ෂික ආදායම් මූලාශ්‍ර වැඩි කළ හැකිය.

■ දිස්ත්‍රික් මට්ටමේ පරිපාලන යාන්ත්‍රණයක් ඔස්සේ සේවා සැපයීම හා සම්පත් සාධාරණ ලෙස බෙදී යෑම මධ්‍යම රජය විසින් සහතික කළ යුතුය.

■ රාජ්‍ය සේවා සැපයීමේදී හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී නව තාක්ෂණය උපරිම වශයෙන් යොදාගත යුතුය. එවැනි ක්‍රියාවලියක ඇති විනිවිදභාවය හා මැදිහත්වීම් නොමැතිකම දූෂණ වංචා සඳහා ඇති අවස්ථා අවම කරනු ඇත.

■ යල්පැනගිය නීති රීති රෙගුලාසි ඉවත් කළ යුතු අතර යල්පැනගිය රාජ්‍ය දෙපාර්තමේන්තු වසා දැමිය යුතුය. රාජ්‍ය සේවා ජනතාවට ලබාදීම වැඩිදියුණු කිරීම අරමුණුකරගත් සමස්ථ ප්‍රතිසංස්කරණයක් එයින් අරමුණු කෙරේ. අලුත් නීතියක් හඳුන්වාදෙන සෑම අවස්ථාවකම පවතින නීති රීතිවල යල්පැන ගිය කොටස් ඉවත් කිරීමට හැකි සෑම උත්සාහයක්ම දැරිය යුත්තේය.

■ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව මත පදනම්ව සියලූ ස්වාධීන කොමිෂන් සභා වල කාර්ය සාධනය හා ක්‍රියාකාරීත්වය පුනරීක්ෂණය කළ යුතුය. අවශ්‍ය තැන්වල අලුතින් අමතර ව්‍යුහ නිර්මාණය කරනු වෙනුවට පවතින රේඛිය ආයතන ශක්තිමත් කිරීමට යෝජනා කෙරේ.

■ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ හා අධ්‍යාපන පීඨවල සියලූම දේශපාලන ක්‍රියාකාරකම් තහනම් කිරීමට නීති සම්මත කළ යුතුය.

## ආර්ථිකය

■ රජය සියලූම වාණිජ කටයුතු වලින් බැහැරව සිටිය යුතුය. ජාත්‍යන්තර හොඳම ආදර්ශ අනුව යමින් ශ්‍රී ලංකාව ස්වකීය උපයෝගිතා හා යටිතල පහසුකම් අංශය පෞද්ගලික ආයෝජන සඳහා විවෘත කළ යුතුය. වාණිජ වත්කම්වල හිමිකාරීත්වට රජය විසින් දරනු ලැබීම වෙනුවට නියාමනය හා

නියාමන විධිවිධාන පැමිණවිය යුතුය. පෞද්ගලික ආයෝජනවලට ඇති බාධා අවහිරතා හඳුනාගෙන හදිසි කඩිනම් අවශ්‍යතා පදනම යටතේ ඒවා ඉවත් කළ යුතු ය

■ රජය විසින් ජාතික අයවැය තුලනය කරනු ලැබීම සහතික කරනු වස් ෆිස්කල් වගකීම් පනත Fiscal Management (Responsibility) Act සංශෝධනය කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් අයවැයක් සම්මත කරගනු ලැබීමෙන් පසු, හදිසි ජාතික තත්වයකදී හැර, රාජ්‍ය වියදමක් පිළිබඳ අලුත් යෝජනා ඉදිරිපත් කරන්නේ නම් වෙනත් තැනක වියදම සීමා කළ යුතුය.

■ වඩාත් සවිබල ගැන්වූ වගකීමක් සහිත මුල්‍ය මණ්ඩලයක් සමග ශ්‍රී ලංකා මහ බැංකුව සම්පූර්ණයෙන්ම ස්වාධීන විය යුතුය. මහ බැංකුවේ කාර්යය විය යුත්තේ උද්ධමනය පහළ තනි අංකයක පවත්වා ගැනීමත් වෙළඳපල පදනම් වූ විනිමය අනුපාත මට්ටමක් පවත්වාගැනීමත්ය. එසේම මුල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වාගැනීම ද මහ බැංකුවේ වගකීමකි.

■ ව්‍යවසායකත්වය තරගකාරීත්වය හා නවෝත්පාදනය පිළිබඳ අමාත්‍යාංශයකට නායකත්වය දීම අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානතම වගකීමක් විය යුතුය. මෙකී අමාත්‍යාංශයට ආර්ථිකය නවීකරණය කිරීම සඳහා සැලසුම් කළ ප්‍රතිපත්ති කඩිනමින් ක්‍රියාත්මක කිරීම, ආර්ථික වර්ධනය හා රැකියා උත්පාදනය, ශ්‍රී ලංකාව ගෝලීය වෙළඳපල සමග සම්බන්ධකිරීම ආදිය සහතික කරනු පිණිස පුළුල් බලතල හිමිවේ. ශ්‍රී ලංකාවේ උපක්‍රමික ස්ථානගතවීම, මානව සම්පත් පදනම , ස්වභාවික සුන්දරත්වය, සංස්කෘතිය හා ස්වභාවික සම්පත් යන කාරණා සංචාරකත්වය විශේෂ නිපැයුම්, තොරතුරු සන්නිවේදන තාක්ෂණ, භාණ්ඩ හුවමාරු සේවා වැනි බොහෝ ආර්ථික අංශවල අසහාය අවස්ථා ජනිත කරයි. අවශ්‍යවන්නේ අප්‍රතිහත ධෛර්යය හා අපේ විභවය යථාර්ථයක් කරගැනීමේ ජාතික යොමුවක් පමණි.

■ පවතින ඉඩම් ප්‍රතිපත්ති නැවත සකස් කළ යුතු අතර හොඳින් සලකා බැලූ ඉඩම් ප්‍රයෝජනයට ගැනීමේ සැලසුමක් ඊට ඇතුළත් විය යුතුය. ඉඩම් සම්බන්ධයෙන් ශ්‍රී ලාංකීය පුරවැසියන්ට ඇති සීමා ඉවත් විය යුතු අතර කෘෂිකාර්මික සංවර්ධනය ට සම්බන්ධ නීති රෙගුලාසි විප්ලවීය ප්‍රතිසංස්කරණයකට භාජනය කළයුතුය. නාගරික ප්‍රදේශවලින් පිටත වාසය කරන සෑම පුරවැසියෙකුටම සිය නිවාස අවශ්‍යතා සඳහා ඉඩම් කොටසක් ලබාදීමට රජය සහතික විය යුතුය.

■ ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කළ හැක්කේ කෘෂිකර්මය (පළතුරු, එළවළු, ධාන්‍ය) මත්ස්‍ය වගා (ධීවර, මත්ස්‍ය වගාව) හා සත්ත්ව පාලනය (කුකුළු, ගව) යනාදියට අදාළව අපනයනය හා දේශීය වෙළඳපල කෙරෙහි යොමුවූ ක්‍රමෝපායයක් අනුගමනය කළ යුතුය. මෙකී ප්‍රතිපත්ති මගින් ග්‍රාමීය, කෘෂිකාර්මික, කුඩා පරිමාන ව්‍යාපාර අංශය, ඉතා සියුම් ලෙස ස්ථාපිත සැකසුම් හා බෙදාහැරීම් අංශ සමග සාධාරණ සහ යුක්ති සහගත කොන්දේසි මත සම්බන්ධවන බවට වගබලාගත යුතුය.

- නිදහස ලැබූ දා පටන් එක තැන පවතින වැවිලි කර්මාන්ත ආර්ථිකය නවීකරණය කළ යුතුය. විවිධාංගිකරණය වූ අපනයන භෝග වගාකිරීමේ හැකියාව ගවේෂණය කළ යුතුය. එමෙන්ම අගය එකතු කළ කෘෂි අපනයන කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කළ යුතුය.

- ඵලදායිතාව මත දිවෙන ජාත්‍යන්තර වශයෙන් තරගකාරී වූ ජාතික මට්ටමේ මානව සම්පත් පදනමක් සංවර්ධනය කළ යුතුය. මෙහිදී ශ්‍රී ලංකාවේ කම්කරු නීති හා රෙගුලාසි ලෝකයේ වඩාත් තරගකාරී ආර්ථිකවලට සමාන අයුරින් සකස් කළ යුතුය. මේ සඳහා පවතින නීති රීති රෙගුලාසි හා පුරුදු වල පෙරැළිකාර වෙනසක් කළ යුතුය.

- ශ්‍රී ලංකාවේ බලශක්ති අංශය පිරිසිදු විකල්ප බලශක්ති මත පදනම් වූ ජාලයක් බවට පරිවර්තනය කිරීම සඳහා කාලානුරූප කඩිනම් වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

- අධිවේගී ජාතික විදුලි දුම්රිය පද්ධතියක් හා පොදු ප්‍රවාහන පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා කාලානුරූප ආයෝජන වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය. ඩීසල් හා පෙට්රල් මගින් බලගැන්වෙන වාහන පියවරින් පියවර භාවිතයෙන් ඉවත්

කරනු සඳහා නිශ්චිත වකවානු නිවේදනය කළ යුතුය. විදුලි බලයෙන් ක්‍රියාත්මක වන රියැදුරන් රහිත ස්වයංක්‍රීය වාහන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සූදානම් කිරීම අවශ්‍යය.

- මධ්‍යම ආදායම්ලාභී සමාජයේ අවශ්‍යතා හා අපේක්ෂාවන් ඉටුවන පරිදි පොදු ප්‍රවාහන පද්ධතිය කැපී පෙනෙන වෙනසකට භාජනය කළ යුතුය. ජාත්‍යන්තර හොඳම ආදර්ශ මගින් මනාව නියාමනය කරනු ලබන රාජ්‍ය පෞද්ගලික හවුල් ව්‍යාපාර යටතේ මෙය කළ හැකි බව පෙනී යයි. මීට අදාළ දේශපාලන තීන්දු බුද්ධිමත්ව හා කඩිනමින් ගත යුතුය.

**මිලින්ද මොරගොඩ**